# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,767- 2012 ජූලි මස 13 වැනි සිකුරාදා - 2012.07.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I කොටස : (III) වැනි ඡේදය - වෙළෙඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ දැන්වීම්

(වෙන වෙන ම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| වෙළෙඳ ලකුණු පිළිබඳ දැන්වීම් … … | 240 |
| වෙළෙඳ ලකුණු පිළිබඳ නිවේදන … … | — |
| පේටන්ට් බලපත්‍ර පිළිබඳ නිවේදන … … | — |
| කාර්මික සැළසුම් පිළිබඳ නිවේදන … … | — |
| විවිධ දැන්වීම් … … | — |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන්, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලි ව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නො ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 අගෝස්තු මස 03 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 ජූලි මස 20 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට භාරදිය යුතු ය.

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති(*වැ.බ.*)

2012 ජූනි මස 23 වැනි දින,
කොළඹ 08.
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

239 -B 80627—3,050 (2012/07)
C1-

# වෙළෙඳ ලකුණු පිළිබඳ දැන්වීම්

## වෙළෙඳ ලකුණු පිළිබඳ කාර්යාලය

වෙළෙඳ ලකුණුවලට අදාළ සියලු ම ලියුම් කියුම් කොළඹ 10, ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 400, "සමාගම් මැදුරේ" 3 වැනි මහලේ පේටන්ට් බලපත්‍ර සහ වෙළෙඳ ලකුණු ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ පේටන්ට් බලපත්‍ර සහ වෙළෙඳ ලකුණු රෙජිස්ට්‍රාර් වෙත එවිය යුතු ය.

## පරීක්ෂා කිරීමේ වේලාවන්

සතියේ සෑම ක්‍රියාකාරී දිනක ම පෙරවරු 9.00 සිට පස්වරු 3.30 දක්වා ලේඛන පරීක්ෂා කිරීම සඳහා මහජනයා වෙනුවෙන් කාර්යාලය විවෘත කර තබනු ලැබේ. පරීක්ෂා කිරීම සඳහා ඉල්ලුම්පත්‍ර සතියේ වැඩ කරන දිනවල පස්වරු 2.00 දක්වා පමණක් භාරගනු ලැබේ.

## වර්ණවලට සීමාවූ වෙළෙඳ ලකුණු

ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු වෙළෙඳ ලකුණක් යම් යම් වර්ණයකට සීමා කරනු ලබන බවට ඉල්ලුම් පත්‍රයක් පිළිබඳ දැන්වීමක සඳහන් වී ඇති කල්හි ඒ සමග ඉදිරිපත් කරනු ලබන වෙළඳ ලකුණේ ලාංඡනයෙහි හැකි තරම් දුරට එම වර්ණයන් සාමාන්‍යයෙන් ප්‍රචාරය වන අන්දමට දක්වනු ලැබේ.

## ආශ්‍රිත කිරීම

මෙහි පළ කර ඇති ලකුණක් , 1979 අංක 32 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහ පනතේ 112 වැනි වගන්තිය යටතේ, තවත් ලකුණක් හා ආශ්‍රිත කොට භාවිතා කරනු ලබන බවට සඳහන් කර ඇති කල්හි එම වෙළෙඳ ලකුණට දී ඇති අංකය ද දක්වනු ලැබේ.

## විරෝධතා දැක්වීම

පහත සඳහන් වෙළෙඳ සේවා හෝ සාමූහික ලකුණු ලියාපදිංචි කිරීම ගැන විරෝධතාවය දැක්වීමට හේතු ඇති යම් කෙනෙකු මෙම *ගැසට් නිවේදනයේ* දින සිට තුන් මාසයක් ඇතුළත ඇම් 2 දරන ආකෘති පත්‍රය (අනු පිටපතකින් ද යුක්තව) මගින් විරෝධතා දැක්වීම ඉදිරිපත් කළ යුතු ය. එබඳු විරෝධතා දැක්වීමක් සඳහා ගාස්තුව රු. 750ක් වන අතර එම ගාස්තුව මුදලින්, චෙක්පතකින්, මුදල් ඇණවුමකින්, තැපැල් ඇණවුමකින් හෝ බැංකු අණකරයකින් ගෙවිය

(1) ලකුණේ අංකය: 106230; (2) ලැබුණු දිනය: 2002.01.02; (3) ප්‍රමුඛතාව ඉල්ලා සිටින්නේ නම් දිනය:—; (4) ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය : මහමඩආච්චි රසික ඉන්ද්‍රජිත් සිල්වා,10-බී, 114/2, මත්තේගොඩ නිවාස සංකීර්ණය, මත්තේගොඩ, පොල්ගස්ඕවිට. — තේ විකිණීමේ ව්‍යාපාරය; (5) ලිපි භාර දීම සඳහා මෙරට ලිපිනය: -; (6) පංතිය: 30; (7) භාණ්ඩ හෝ සේවා : තේ; (8) ලකුණේ සටහන:

**PRABHA TEA**

අංක 68865 දරන ලකුණේ අයිතිකරුට *ගැසට් නිවේදනයේ* පිටපතක් භාර දිය යුතුය.

ආචාර්ය ඩී. එම්. කරුණාරත්න,
බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්.

2005 දෙසැම්බර් මස 30 වැනි දින,
ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය,
කොළඹ.

07–383 –2012.07.13 වැනි දින අංක 1,767 දරන *ගැසට් පත්‍රය.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.